(6)

243271

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
රෙජිස්ට්‍රාර් කාර්යාලය
03 - 6 - 1993
SRI LANKA

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධිත) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1993 පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 45 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1993 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 3/92

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ අධිකරණයේ පිස්කල් වෙත" යන වචන වල සිට "ඒ පිස්කල් විසින් අධිකරණය වෙත ආපසු යැවිය යුතුය." යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

101 වන අධිකාරයේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "ඒ අධිකරණයේ පිස්කල්වරයා වෙත හෝ විත්තිකරු පදිංචිව සිටින්නේ ඒ සමාන අධිකරණ බලයක් ඇති අධිකරණයක අධිකරණ බලසීමාව තුළ ද ඒ අධිකරණයේ පිස්කල්වරයකු වෙත හෝ විත්තිකරු පදිංචිව සිටින්නේ යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් තුළ ද ඒ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වෙත හෝ භාරදිය යුතුය. ඒ පිස්කල්වරයා හෝ ග්‍රාම නිලධාරි විසින් ඒ සිතාසිය විත්තිකරු වෙත හෝ එක් විත්තිකරුවකුට වැඩි ගණනක් ඇත්තේ නම්, ඒ එක් එක් විත්තිකරු වෙත හෝ යථා පරිදි භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු ය. තවද, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පිස්කල්වරයකුට සිතාසි භාරදෙනු ලැබූ අවස්ථාවක, භාරදීම ඇත්ත වශයෙන්ම පවරා ඇති නිලධරයා විසින් හෝ ග්‍රාම නිලධාරියකුට සිතාසි භාර දෙනු ලැබූ අවස්ථාවක, ඒ ග්‍රාම නිලධාරි විසින් හෝ යථා පරිදි සහතික කරන ලද ඒ අණ පත්‍රය සහ එය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ වාර්තාව අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ "පිස්කල්" යන වචනය යෙදෙන කවර හෝ විටක "අවස්ථාවෝචිත පරිදි, පිස්කල්වරයා හෝ ග්‍රාම නිලධාරි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 370 වන වගන්තියේ "පිස්කල් කෙනකු හෝ නියෝජ්‍ය පිස්කල් කෙනකු" යන වචන යෙදෙන කවර හෝ විටක "අවස්ථාවෝචිත පරිදි, පිස්කල්වරයකු හෝ නියෝජ්‍ය පිස්කල්වරයකු හෝ ග්‍රාම නිලධාරි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 370 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඩී 025356 —6,730 (92/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 371 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 371 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "පිස්කල්ගේ හෝ නියෝජ්‍ය පිස්කල්ගේ වාර්තාව" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, පිස්කල්වරයාගේ හෝ නියෝජ්‍ය පිස්කල්වරයාගේ හෝ ග්‍රාම නිලධාරීගේ වාර්තාව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "පිස්කල් විසින් ඒ එකිනෙකෙහි කෙටි අත්සන හා ආතම යෙදිය යුතු ය." යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, පිස්කල්වරයා හෝ නියෝජ්‍ය පිස්කල්වරයා හෝ ග්‍රාම නිලධාරී විසින් ඒ එකිනෙකෙහි කෙටි අත්සන හා දිනය යෙදිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ අංක 17 දරන ආකෘතිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"අංක 17 [55 වන සහ 364 වන වගන්තිය]

සිතාසි භාර කරවීම සඳහා පිස්කල්වරයා වෙත හෝ ග්‍රාම නිලධාරී වෙත යවන අණ පත්‍රයේ ආකෘතිය

(ශීර්ෂය)

................ අධිකරණයේ පිස්කල්වරයා/......... කොට්ඨාසයේ

ග්‍රාම නිලධාරී වෙත ය.

දෙවන පිටපත සහිතව, මේ සමග ඔබට එවනු ලබන ඉහත සඳහන් නඩුවේ සිතාසි එහි නියම කොට ඇති එක් එක් තැනැත්තාට නොපමාව භාර දී සිතාසියේ දෙවන පිටපතක් හා පැමිණිල්ලේ පිටපත්වලින් එකක් (නැතහොත් පැමිණිල්ල සමග ඉදිරිපත් කරනු ලබන සංක්ෂිප්ත ප්‍රකාශවලින් එක් පිටපතක්) ඒ එක් එක් තැනැත්තා වෙත තබන්න ; නැතහොත් ඔහුට භාර දෙන්න. තවද 19......... මස ...... වන දින හෝ ඊට පෙර මේ අධිකරණයට මේ අණ පත්‍රය ඔබ විසින් ක්‍රියාවේ යොදවනු ලැබූ ආකාරය සහතික කර දන්වා එවන්න. ප්‍රදර්ශිතයක් වශයෙන් සිතාසිය ඔබගේ සහතිකයට අමුණා එවන්න.

අධිකරණයේ අණ පරිදි,

(අත්සන් කළේ) ..........................

රෙජිස්ට්‍රාර්.

19.........මස......වන දිය."

සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.